ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 893,887,711 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම සඳහා මේ වනවිට කටයුතු කරමින් පවතී. මෙම ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කළ පසු මෙම අඩුපාඩු සියල්ලම ඉවත් කිරීමට හැකියාව පවතී. ඒ අනුව එම දෝෂය ඉදිරියේදී නිවැරදි කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු. 1,104,000 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී වැඩ නිමකර තිබුණු පිරිවැය රු. 1,934,137 ක් වූ වෛද්‍ය පීඨයේ කාය විච්ඡේදන විද්‍යාගාරය නවීකරණය කිරීම ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ අංශයෙන් තොරතුරු ලබාගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කෙරීගෙන යන වැඩ හා ජංගම නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලීය ජල අවශ්‍යතා සපුරාගන්නා ලද ජල පවිත්‍රාගාරය සහ අක්කර 02 රූඩ් 01 ක් පමණ වූ ඉඩම් කොටස් 02 ක් පඹහින්න ජල යෝජනා ක්‍රමය සඳහා විධිමත් පවරාදීමකින් තොරව 2018 වර්ෂයේදී එහි වටිනාකම් පිළිවෙලින් රු. 1,600,000 ක් හා රු. 900,000 ක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී සොයාබලා කටයුතු කරනු ලැබේ. | විශ්වවිද්‍යාලය සතු වත්කම් විධිමත්ව පවරාදීමට පෙර ගිණුම් වලින් ඉවත් නොකළ යුතුය. |
| (ඈ) | උපදේශන සේවා ගාස්තු ලබා ගැනීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් පවරන ලද නඩුව අනුව 2017 සැප්තැම්බර් 29 දින ඔහු වෙත අදාළ ගාස්තුව ගෙවන ලෙස ලැබී තිබූ අධිකරණ නියෝගය ප්‍රකාරව ගෙවිය යුතු අසම්භාව්‍ය වගකීම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදනය කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අධිකරණ තීන්දුව මඟින් බේරුම්කරණ ප්‍රදානය බලාත්මක කරන බව දන්වා තිබුණද, ගෙවිය යුතු මුදල නිශ්චිතව දක්වා නැත. එබැවින් ඉදිරියේදී ප්‍රතිපාදන වෙන්කිරීමට හෝ අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කිරීමට හෝ අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතියෙන් (Accelerating Higher Education and Development Project) (AHEAD) සමාලෝචිත වර්ෂය තුළ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් පිළිවෙලින් රු. 207,169,036 ක් හා රු. 207,105,986 ක් ද වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 63,050ක මුදල් ශේෂය ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ව්‍යාපෘතියෙන් මිලදී ගන්නා ලද ජංගම නොවන වත්කම් ප්‍රාග්ධනිත කරන ලදී. | විශ්වවිද්‍යාලය වෙත ලැබෙන සියළු මුදල් ලැබීම්, ගෙවීම් හා අත ඉතිරි ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු. 1,873,417 ක් වූ පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂවල සිට පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු මුදල් පදනම මත ගිණුම්ගත කර ඇත. එම දෝෂය ඉදිරියේදී නිවැරදි කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා ගාස්තු ආදායමෙන් සිසුන් වෙත නැවත ගෙවන ලද එකතුව රු. 1,667,000 ක් දෝෂ සහගත ලෙස එම ප්‍රමාණයෙන් ආදායම් ගිණුම හා විලම්භිත ආදායම් ගිණුම පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම අඩුවෙන් හා විලම්භිත ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විවිධ තැන්පතු | 1,235,430 | උපලේඛන | ඉදිරියේදී මේ සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | විවිධ තැන්පතු ගිණුමේ පවතින ශේෂ හඳුනාගැනීමට හැකි පරිදි ලේඛන විධිමත්ව පවත්වාගෙන යා යුතුය. |

**1.6 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන එකතුව රු. 62,686,386 ක් වූ විවිධ ණය හිමි ශේෂ 08 ක් හා ඉකුත් වර්ෂයේ සිට මහපොළ භාරකාර අරමුදලට ගෙවිය යුතුව පවතින රු. 2,201,150 ක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි. | ඉදිකිරීම් නිමකර ඇති දැනට භාවිතා කරන ගොඩනැගිලි 06 ක් සඳහා අවසාන බිල්පත් ඉදිරිපත් නොවීම මත එම ශේෂ ගෙවීමට නොහැකි වී ඇත. මහපොළ භාරකාර අරමුදලට ගෙවිය යුතු මුදල් ඉදිරියේදී නිරවුල් කරනු ඇත. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල් ආයෝජනය කළ හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. 56,568,786 ක මුදලක් ස්ථාවර තැන්පතු 11 ක ආයෝජනය කර තිබුණි. | මෙම ස්ථාවර තැන්පතු අතරින් කිහිපයක්ම ස්වයං උත්පාදන අරමුදල් සහිත ඒකක මඟින් කරන ලද ආයෝජනයන් වන අතර, එම තැන්පතු සඳහා යොදාගෙන තිබෙන්නේ අදාළ අංශ මඟින් උත්පාදනය කරන ලද මුදල්ය.<br>එමෙන්ම ඉහත සඳහන් අගය තුළ ඇතුළත් අනෙක් ස්ථාවර තැන්පත් වන ක්‍රීඩා සංවර්ධන අරමුදල හා ධර්හැම් විශ්වවිද්‍යාල අරමුදල ද විශේෂිත අරමුණු සහිතව ඇති කළ අරමුදල් වන අතර, එම ස්ථාවර තැන්පත් ආරම්භ කිරීමේදී ද පාලක සභා අනුමැතිය ලබාගෙන ඇත. | මුදල් පනත හා චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) | සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද එකතුව රු. 6,020,818 ක් වූ පුනරාවර්තන අත්තිකාරම් 99 ක් පියවීම සඳහා දින 22 සිට දින 363 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. | දිගින් දිගටම සිහි කැඳවීම් ලිපි යැවුවද පියවීමට උත්සුක නොවීම නිසා මෙම ප්‍රමාදය හටගෙන තිබුණි. ඉදිරියේදී මෙම වරද සිදු නොවීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 371(5) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 29 කදී ව්‍යාපෘති, පුනරාවර්තන සහ පර්යේෂණ අත්තිකාරම් වෙනුවෙන් දෙන ලද රු. 9,206,526 ක් පියවා නොතිබුණි. | අත්තිකාරම් ලබාගත් පාර්ශවයන් දැනුවත් කලද පියවීම සිදු කර නොමැති බවත්, ඉදිරියේ දී මේ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 394 හා 396 | කල් ඉකුත් වූ හා අවලංගු කර ඇති එකතුව රු. 1,319,084 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 571 | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 19,549,083 ක් වූ රැඳවුම් මුදල් නියාදනය කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය මඟින් ස්ථාවර වත්කම් මිලදී ගැනීමේදී ඒ සඳහා ගෙවනු ලබන මුදලින් රඳවා ගන්නා ලද මුදල් වන බැවින් අදාළ පාර්ශවයන්ට නැවත ගෙවීමට විශ්වවිද්‍යාලය බැඳී සිටී. එබැවින් මේවා නියාදනය කළ නොහැක. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 12 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු. 55,368,659 ක් 2021 අප්රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි. එහි ඇතුළත් වාරික වශයෙන් ගෙවීමට එකඟ වූ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 28,079,397 ක් 2018 වර්ෂයේ සිට කිසිදු වාරිකයක් අයකරගෙන නොතිබුණි. | වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතුව තිබෙන රු. 28,079,397 ක් නොගෙවන බැවින්, නීතිමය පියවර ගැනීම සඳහා අදාළ ලිපි ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | | |
| (i) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන චක්‍රලේඛය | නිල නිවාස 30 ක පදිංචි නිලධාරීන්ගෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 2,266,030 ක නිල නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි. | චක්‍රලේඛයට අනුව සුදුසුකම්ලත් නිලධාරීන් වන්නේ පත්වීම් ලිපියේ නිල නිවාසයකට හෝ නිල නිවාසයක් සඳහා වන දීමනාවකට හිමිකම් ලබන බවට සඳහන් නිලධාරීන් වුවත් විශ්වවිද්‍යාලයේ පත්වීම් ලිපි කිසිවක එවැනි සඳහනක් නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය මගින් ඉඩදී තිබූ වියදම් වලින් බැහැර වෙනත් වියදම් දැරීම සඳහා බැඳුම්කර කඩකිරීම් අරමුදලේ පැවති රු. 54,550,464 ක් වටිනා ස්ථාවර තැන්පතු 17 ක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබා ගෙන තිබුණි. | 2020 වර්ෂයේ රටතුළ උද්ගත වූ කොරෝනා වසංගත තත්වය හමුවේ මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය ආයතන වලට වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා කරන ලදී. විශ්වවිද්‍යාලයේ අවම වියදම් පියවා ගැනීම සඳහා හෝ ප්‍රමාණවත් පරිදි අරමුදල් නොලැබුණ අතර එම තත්ත්වය හමුවේ වුවද විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම අනිවාර්ය විය. එබැවින් විශ්වවිද්‍යාලයීය මූල්‍ය තත්ත්වය යහපත්ව පවත්වා ගැනීමේ අරමුණෙන් අරමුදල් හිඟයට පිළියමක් ලෙස ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීමට තීරණය කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය | සියලුම ස්වයං මූල්‍ය උත්පාදිත (Self-Financing Activities) ක්‍රියාකාරකම් ප්‍රතිපත්තියක් ලෙස වියදම් ආවරණය කර ගැනීමේ පදනම මත (Cost Recovery) සහ ලාභ ඉපැයීම අරමුණු කර නොගත් (Non Profited Basis) පදනම මත ක්‍රියාත්මක කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,298,902 ක ශුද්ධ මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 91,103,424 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 89,305,389 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,798,035 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු. 177,205,000 කින් වැඩිවී තිබුණද, සේවක පාරිශ්‍රමික රු. 198,036,855 කින් වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම හා දත්ත ඇතුළත් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 1,370,300 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ සියලුම කටයුතු විශ්වවිද්‍යාලය මඟින් සිදු කිරීමට තීරණය කර ඇති අතර පැරණි ගිවිසුම අවලංගු කර ඇත. ඒ අනුව, ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම හා එහි සියලු කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර, එම කමිටුව අවසන්වරට රැස් වූ අවස්ථාවේදී සාකච්ඡා කළ පරිදි ස්ථාවර වත්කම් හඳුනාගැනීම, කේතකරණය හා පරිගණක පද්ධතිය සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් වනවිට පර්යේෂණ කාලසීමාව අවසන් වී තිබුණු පර්යේෂණ යෝජනා 21 ක් සඳහා පර්යේෂණ ප්‍රදාන ලෙස රු. 23,024,892 ක් ගෙවා තිබුණ ද 2021 මාර්තු වනවිටත් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2021 මාර්තු මාසය වනවිට අවසන් පර්යේෂණ වාර්තා 09 ක් ඉදිරිපත් කරන ලද අතර, රට තුළ පවතින වසංගත තත්ත්වය නිසා ඉතිරි පර්යේෂණ ව්‍යාපෘති 12 සඳහා 2021 ජූලි මස 31 වන දින දක්වා කාල දිගුවක් ලබා දීමට විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුව තීරණය කරන ලදී. | නියමිත කාලසීමාව තුළ පර්යේෂණ අවසන් කර වාර්තා නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලය වෙනුවෙන් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා 2007 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර රු. 1,494,543 ක මූලික වියදමක් ලෙස දරා තිබුණ ද 2021 අප්‍රේල් වනවිටත් ඉදිකිරිම් කටයුතු ආරම්භ කිරිමට කටයුතු කර නොතිබුණි. | පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු කඩිනම් කර ගැනීම සඳහා පත් කරන ලද කමිටුව විසින් ලබාදෙන ලද සංකල්පීය පත්‍රිකාව, ගොඩනැගිල්ලේ ඉඩ හා අනෙකුත් අවශ්‍යතා දැක්වෙන විස්තර පත්‍රිකාව සහ දළ සැලැස්ම සහිත වාර්තාව 2021 මාර්තු 29 දින පැවති පාලක සභාව වෙත යොමු කර ඇත. ඒ අනුව වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. | පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කාර්යක්ෂම කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ හා පරිසර අධ්‍යයන ව්‍යාපෘති සඳහා දේශීය හා විදේශීය ආයතන මඟින් ලබා දී ඇති අරමුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 4,418,209 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘති සම්බන්ධීකරණ පාර්ශවයන් විසින් අදාළ මුදල් ඉල්ලුම් නොකිරීම නිසා මෙම මුදල් ඉතිරි වී ඇත. | අදාළ අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 ජුනි මාසයේදී රු. 15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Desktop පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතර වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේදී ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. 2018 මැයි 19 දිනැති පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත ලෙස කටයුතු කර ඇති නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළයුතු බව නිගමනය කර තිබුණද, 2021 අප්‍රේල් වනවිටත් විනයානුකූල ක්රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. 2018 ජූනි 21 දින රු. 1,596,400 ක් වූ රැඳවුම් මුදල් ද කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. | මෙහිදී රැඳවුම් මුදල නිදහස් කර ඇත්තේ කමිටු නිර්දේශය මත වේ. කමිටු නිර්දේශ සලකා බලා ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | සියළු මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු අතර, ඊට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අගෝස්තු 21 සිට 30 දක්වා නෙදර්ලන්තයේ පැවැත්වුණු PIM International on management වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව හිටපු ලේඛකාධිකාරිවරයා සහභාගී වීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය උපයාගත් අරමුදල් වලින් රු. 1,200,000 ක් වැයකර තිබුණි. එම සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීමට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය | මෙම නිලධාරියා විශ්වවිද්‍යාලයෙන් නිදහස් කර ඇත්තේ යම් අයවීමක් ඇත්නම් එම අයවීම අයකර ගැනීමට යටත්වය. ඒ අනුව එම මුදල් අයකර ගැනීම සඳහා ලිපි හා සිහිකැඳවීම් යවා ඇති අතර, ඒ සඳහා ඔහුගෙන් ලැබෙන පිළිතුරු අනුව යථෝක්ත වියදම අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | විශ්වවිද්‍යාලය විසින් දරා ඇති වියදම ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

කර තිබුණද එම මුදල අයකර ගැනීමකින් තොරව 2020 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිලධාරියා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත විශ්වවිද්‍යාල පාලක සභාව විසින් මුදාහැර තිබුණි.

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයට අදාළව පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ භාණ්ඩ හා උපකරණ ලබා දී තිබුණ ද ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2021 මාර්තු වනවිටත් එම උපකරණ ඌන උපයෝජිතව පැවතුණු අතර බොහෝ උපකරණ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. | වර්තමානයේ දී මේ සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය ආරම්භ කර ඇති අතර දැනට පවතින පහසුකම් සමඟ මෙම ඒකකය ඵලදායී ලෙස ක්‍රියාත්මක වේ. | යටිතල පහසුකම් සංවර්ධනය කර භාවිතා කළහැකි භාණ්ඩ හා උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදියර රු. 315,051,433 ක (VAT රහිත) වටිනාකමකට මාස 24 ක් තුළ වැඩ අවසන් කිරීම සඳහා 2018 ජනවාරි 30 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම හා කළ වැඩ වටිනාකම වශයෙන් රු. 83,010,286 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද, වැඩ ඉංජිනේරු විසින් සහතික කරන ලද වටිනාකම රු. 43,058,226 ක් වූයෙන් රු. 39,951,060 ක් වැඩිපුර ගෙවා තිබිය දී ඉදිකිරීම් කටයුතු 2020 පෙබරවාරි සිට අතහැර දමා තිබුණි. අත්තිකාරම් | 2019 ඔක්තෝබර් 28 දිනට කරන ලද වැඩ වටිනාකම රු. 43,058,226 ක් වන අතර, 2020 පෙබරවාරි මස වනතෙක් කරන ලද ඉදිකිරීමෙහි වටිනාකම ගණනය කර නොමැත. එසේම වැඩ වටිනාකමින් රු.4,305,883 ක් රඳවා ගැනීමේ මුදල් සඳහාද අත්තිකාරම් බැඳුම්කරය සඳහා රු. 9,567,671 ක් සහ ඉතිරි මුදල් (balance payment) ලෙස රු. 13,563,063 ක් රඳවා තබාගෙන ඇති අතර, රු. 15,752,571.65 ක් වූ කාර්යසාධන ඇපකරය ද විශ්වවිද්‍යාලය විසින් අය කර (encash) ගන්නා ලදී. කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් | ගැටළු නිරාකරණය කරගෙන ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| බැඳුම්කරය 2020 පෙබරවාරි 07 දින අවසන් වී තිබූ අතර එය මුදල් කර ගැනීමට හෝ බැඳුම්කරයේ කාලසීමාව දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කරය දීර්ඝ නොකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර මුදල විශ්වවිද්‍යාලයට ගෙවන ලෙස බැංකුව වෙත නියෝග කළද සෙලාන් බැංකුව විසින් එම බැඳුම්කරය තවදුරටත් දීර්ඝ කළ නොහැකි බව 2020 මාර්තු 12 දින දන්වා ඇත. තවද, මෙම කර්මාන්තය ඉදිරියට කරගෙන යාම සඳහා අමාත්‍යාංශ අවසරය මත ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ ඇත. | |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 506 කින් තනතුරු 110 ක් හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු 530 කින් තනතුරු 132 ක් පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලෙස රු. 19,854,304 ක් ගෙවීමට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැවති පුරප්පාඩු ද හේතු වී තිබුණි. | මේ වනවිට පවතින පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම්වලට අදාළ කටයුතු සිදුකරමින් පැවතියද, කොවිඩ් වසංගතය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වීම,<br>පරිපාලන තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්පත් නොලැබීම හා<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 හා 02/2020 ට අනුව ප්‍රාථමික සේවා ගණයේ තනතුරු බඳවා ගැනීම අත්හිටුවා තිබීම ද පුරප්පාඩු ප්‍රමාණය ඉහළ යාමට හේතු වී ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**4.1 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දැනුවත්වී තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟාකර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබීම හේතුවෙන් එම අරමුණු වලට අදාළ ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව හඳුනාගත් ඉලක්ක 2018 හා 2019 වාර්ෂික වාර්තාවලට ද 2021 ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |